**ශීර්ෂය 236 - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්වාගණනය නොකළ මතය**

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 13 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්වාගණනය නොකළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත්කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩ අපහරණයෙන් ලත් රු.93,680 ක ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ නොදක්වා ගාස්තු, අධිභාර, දඩමුදල් හා බලපත්‍ර ආදායමක් ලෙස දක්වා තිබුණි. | නියමිත ආකෘතිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට නිලධාරීන්ට උපදෙස් දී ඇත. |

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත් හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) ඇප ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 891 (1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891 (1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | ඇප ලේඛනයක් පවත්වාගෙන යාමට අදාළ නිලධාරීන් හට උපදෙස් දුන් බව. |
| **(ආ) වාහන ලොග් පොත්** | | |
| මුදල් රෙගුලාසි 1645 (අ) ප්‍රකාරව වාහන ලොග් පොත් යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 1645 (අ) හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව සෑම වාහනයක් සඳහාම පවත්වාගෙන යනු ලබන ලොග් පොත් යාවත්කාලීන කල යුතු වීම. | වාහන ලොග් පොත් යාවත්කාලීන කිරීමට අදාළ නිලධාරීන් හට උපදෙස් දුන් බව. |
| **(ඇ) නිවාඩු ලේඛනය** | | |
| ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.7 ප්‍රකාරව නිවාඩු පිළිබඳ ලේඛනයක් පවත්වා ගියද, යාවත්කාලීන කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.7 වගන්තිය ප්‍රකාරව නිවාඩු ලේඛනය යාවත්කාලීන කිරීම කල යුතු වීම. | නිවාඩු ලේඛනයේ තිබූ අඩුපාඩු නිවැරදි කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදුන් අතර නිවාඩු ලේඛන යාවත්කාලීන කිරීම මේ වන විට සිදු කරමින් පවතී. |

### 1.6.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු විය. එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි . | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මූල්‍ය ප්‍රකාශනය භාණ්ඩාගාර ආකෘතියට අනුව ඉදිරිපත් කර ඇති බව හා ඉදිරියේදී මෙම අඩුපාඩු අවම කරගැනීමට කටයුතු කරන බව. |
| (ආ) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි . | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නිලධාරීන් ලබා දී නොමැති බැවින් අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපිත කිරීමට නොහැකි වී ඇති බව. |

### 1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 2016 මාර්තු 31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 ඡේදය | 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2019 මාර්තු 17 දින විගණකාධිපති වෙත | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා නියමිත | 2019 මාර්තු 12 දින වන විටත් භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර තිබුණද, |

| | | | |
|---|---|---|---|
| | ඉදිරිපත් කල යුතු වුවද, එම වාර්තා 2019 ජුනි 10 දින ඉදිරිපත් කර තිබුණු අතර, ගබඩාවේ තිබූ පොත් සමීක්ෂණය කර එම වාර්තාවට ඇතුළත් කර නොතිබුණි. | දිනට අදාල පාර්ශව වෙත යැවීමට කටයුතු කල යුතු වීම. | අපහරණ කටයුතු සිදුකිරීම ප්‍රමාද වී තිබුණු බව සහ කඩිනමින් අවසන් වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කරන බව . |
| (ආ) 2006 මාර්තු 13 දිනැති අංක 01/2006 ඒකාබද්ධ සේවා චක්‍රලේඛයට අදාලව 2016 දෙසැම්බර් 22 දිනැති අංක 2004/පුස/1 (2016-සංශෝධිත) දරන ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩල චක්‍රලේඛයේ 3.1 ඡේදය. | පුස්තකාල පොත් 6415 ක් සම්බන්ධයෙන් වාර්ෂික තොග සමීක්ෂණ පවත්වා නොතිබුණ අතර එම පුස්තකාල පොත් තොගයේ වටිනාකම 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් යටතේද දක්වා නොතිබුණි. | පුස්තකාල පොත් සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු බව හා ඒවායේ වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කල යුතු වීම. | සමීක්ෂණ මණ්ඩලයක් පත්කර 2019 ජුනි 30 දිනට පොත් සමීක්ෂණය සිදු කිරීම සඳහා කටයුතු යොදා ඇති බව හා වටිනාකම ගණනය කර 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට නිලධාරීන්ට උපදෙස් දුන් බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත විකුණුම් ගාස්තු හා අනෙකුත් ලැබීම් රු. මිලියන 61.5 ක් වුවද, සත්‍ය ආදායම රු. මිලියන 37.86 ක් හෙවත් ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 61 ක් පමණක් විය. | ආදායම් ඇස්තමේන්තු කිරීමේදී හැකිතාක් දුරට උපයාගත හැකි ආදායම ඇස්තමේන්තු කල යුතු බව. | පාඨමාලා සඳහා වන සහභාගිත්වයේ අඩුවීම හා දෙසැම්බර් මාසය සඳහා සිසුන් බඳවාගැනීම කල්දැමීම, ඇස්තමේන්තු ආදායම අඩුවීමට හේතු වී තිබුණි. |

**2.2. වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) අධි ප්‍රතිපාදන සලසා තිබීම<br><br>පුනරාවර්තන වැය විෂයයක රු.300,000 ක් වූ ප්‍රතිපාදන, මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයයකට මාරු කර තිබියදීත්, එම වැය විෂයය යටතේ සියයට 51 කට සමාන රු.51,149 ක මුදලක් ඉතිරිව තිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු මගින් අධි ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු නොකල යුතු වීම. | ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවන ලෙස ඇස්තමේන්තු සකස් කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව. |
| (ආ) මූලධන වැය විෂයයක රු.500,000 ක් වෙනත් වැය විෂයයකට මාරු කර තිබියදීත්, එම වැය විෂයය යටතේ සියයට 55 කට සමාන රු. මිලියන 1.92 ක මුදලක් ඉතිරිව තිබුණි. | -එම- | භාෂා ප්‍රවීණත්වය මැනීමේ පරිගණක මෘදුකාංගය සකස් කිරීම සඳහා සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු වී ඇති අතර 2019 වර්ෂයේදී සුදුසු සැපයුම්කරුවෙකු සමඟ ගිවිසුම්ගත වී ඇත. |

**2.3. වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) ජාතික ඒකාබද්ධතා සංහිඳියා සහ රාජ්‍ය භාෂා අමාත්‍යාංශයෙන් 2018 වර්ෂයේ දී ක්‍රියාකාරකම් 09 ක් සඳහා දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ රු.මිලියන 18.54 ක් වූ ප්‍රතිපාදනවලින් රු.මිලියන 5.37 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | ප්‍රතිපාදන ලබා දී තිබූ කාර්යය ප්‍රමාදයකින් තොරව ඉටු කිරීමට කටයුතු කල යුතු වීම. | අමාත්‍යාංශයෙන් ක්‍රියාකාරකම් 9 ක් සඳහා රු. 24,048,388.00ක ප්‍රතිපාදන ලබාදී තිබුණද, අපේක්ෂිත පරිදි වියදම් සිදු නොවූ බැවින් ඉන් රු.මිලියන 55 ක මුදලක් ආපසු අමාත්‍යාංශය වෙත පවරා ගෙන තිබුණි. |
| (ආ) අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් රු.300,000 ක් වැය කර 2018 වර්ෂයේදී ඉටු කරවා ගැනීමට සැලසුම කර තිබූ “Converting the spoken | ප්‍රතිපාදන ලබා දී තිබූ කාර්යය ප්‍රමාදයකින් තොරව ඉටු කිරීමට | සැපයුම්කරුවෙකු ඉදිරිපත් නොවීම මත මෙම කාර්යය ඉටුකරවා ගත නොහැකි විය. |

Tamil into Audio book" හී කටයුතු කිසිවක් සමාලෝචිත වර්ෂයේදී සිදුකර නොතිබුණි. | කටයුතු කල යුතු වීම.

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 ප්‍රසම්පාදනය

---------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------- | ----------------------------------- |
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව වටිනාකම රු.585,200 ක් වූ ග්‍රන්ථ 8,000 ක් පෙර වර්ෂයේ මුද්‍රණ කටයුතු කරන ලද ආයතනයෙන්ම වැඩි මිලකට මුද්‍රණය කරවා ගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතු වීම. | සීමිත කාලයක් තුළ ප්‍රසම්පාදන නියමයන් ප්‍රායෝගිකව ඉටුකරගත නොහැකිවීමේ ගැටළු සහගත තත්ත්වය මත පෙර වර්ෂයේ මුද්‍රණ කටයුතු කරන ලද ආයතනයෙන්ම මුද්‍රණය කරවා ගෙන තිබුණු බව. |

### 3.2 අනාර්ථික ගනුදෙනු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------- | ------------- | ----------------------------------- |
| සිංහල-දෙමළ සහ දෙමළ-සිංහල පරිවර්තන මෘදුකාංග 2 ක් සකස් කිරීම සඳහා රු.මිලියන 7.24 ක් වැයකර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී සිංහල-දෙමළ පරිවර්තන කටයුතු සිදු කරන ලද පිටු ගණන 529 ක් පමණක් වූ අතර, දෙමළ-සිංහල පරිවර්තන කටයුතු කිසිවක් සිදු කර නොතිබුණි. | පරිවර්තන කටයුතු සඳහා සකස් කර ඇති මෘදුකාංග උපරිම ලෙස උපයෝජනය කිරීම. | සිංහල - දෙමළ /දෙමළ -සිංහල පරිගණක මෘදුකාංගය සාමාන්‍ය රාජකාරී ලිපි පරිවර්තනය වැනි කටයුතු සඳහා සැලසුම් කර ඇත. |

## 4. යහපාලනය

---------------

### 4.1 අභ්‍යන්තර විගණනය

-----------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 133 හා 2009 ජුනි 09 දිනැති අංක DMA /2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 1 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | මෙම නිරීක්ෂණය පසුගිය වර්ෂයන්හිදී ද, පෙන්වා දී ඇති හෙයින් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය සඳහා නිලධාරීන් ලබා දෙන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇති බව සහ දැනට අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් එම කාර්යය ඉටු කරනු ලබන බව. |

### 4.2. විගණන හා කළමනාකරණ කමිටුව

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව රාජ්‍ය භාෂා දෙපාර්තුමේන්තුව විසින් 2018 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කල යුතු වීම. | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමත් සමඟ විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට කටයුතු කරන බව. |

**5. මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට 216 ක් වූ තත්‍ය කාර්යය මණ්ඩලය තුල පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 50 ක් වී තිබුණි. මින් තෘතියික මට්ටමේ පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 34 ක් විය. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා කාර්ය මණ්ඩල බඳවා ගැනීම කඩිනම් කිරීම හා අතිරික්ත කාර්ය මණ්ඩල සංඛ්‍යාවක් වේ නම් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර අවශ්‍ය පියවර ගැනීම. | පුරප්පාඩු තනතුරු සඳහා නිලධාරීන් ලබා දෙන ලෙස රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇති බව හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු දෙපාර්තමේන්තු මට්ටමින් බඳවා ගැනීමට කටයුතු කරන බව. |